# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2161/42 - 2020 පෙබරවාරි මස 07 වැනි සිකුරාදා - 2020.02.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) වැනි ව්‍යවස්ථාවට හා 46(1)(අ) වැනි ව්‍යවස්ථාවට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2019 දෙසැම්බර් මස 10 වැනි දිනැති අංක 2153/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව, අංක 2159/15 හා 2020 ජනවාරි මස 22 දිනැති සහ අංක 2159/47 හා 2020 ජනවාරි මස 24 දිනැති ගැසට් නිවේදනවලින් සංශෝධිත එකී උපලේඛනය, වහාම ක්‍රියාත්මකවන පරිදි තවදුරටත් පහත උපලේඛනයේ සඳහන් ලෙස සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2020 පෙබරවාරි මස 07 වැනි දින.
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි අංක (24) "විදුලිබල හා බලශක්ති අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 2 වැනි අයිතමය -

2. "තාපය හා ගල්අඟුරු යනාදී මූලාශ්‍රයන් මගින් විදුලිය සහ අනෙකුත් බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, සංවර්ධනය සහ අධීක්ෂණය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 5 වැනි අයිතමය -

5. "බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම" වශයෙන් ;


1A - G 031851 — 382 (2020/02)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) එහි I වැනි තීරුවෙහි 4 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 3 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි 2, 3 සහ 5 අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඊ) එහි II වැනි තීරුවෙහි අයිතම 1 සිට නැවත අංකගත කිරීමෙන් ;

(උ) එහි III වැනි තීරුවෙහි පහත සඳහන් අයිතමය ඉවත් කිරීමෙන් ;

"ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත (2007 අංක 35)"

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.